# වාර්ෂික වාර්තාව

# 2020

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**සභාපතිතුමාගේ පණිවිඩය**



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 වර්ෂයේ කාර්යසාධනය විස්තරාත්මකව දැක්වෙන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ හදපිරි සතුටිනි. අනපේක්ෂිතව ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුවද අධිකාරිය 2020 වර්ෂය පුරා ප්‍රගතියක් අත්කරගෙන ඇති බව මෙහිදී දක්වනු කැමැත්තෙමි.

අපගේ ප්‍රධානතම ව්‍යවස්ථාපිත අරමුණ වන්නේ තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අප කණ්ඩායමේ සහභාගීත්වයෙන් ඉහළ ඉලක්ක ළඟාකරගත හැකි කෙටි කාලීන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අපි අරමුණු කරගෙන සිටින්නෙමු.

අප විසින් දැනුවත් පාරිභෝගික මෙන් ම වෙළඳ ප්‍රජාව වත්කමක් ලෙස සලකන බැවින් මහජනතාව සහ වෙළෙන්දන් දැනුවත් කිරීම සඳහා මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් 147 ක් සහ වෙළෙන්දන් දැනුවත් කිරීමේ වැඩසටහන් 88 ක් සමාලෝචිත වර්ෂයේ දී පවත්වන ලදී. පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් බාල පරපුර සවිගැන්වීමේ අරමුණින් වර්ෂය තුළ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 585 ක් පවත්වන ලදී.

වැටලීම් 15,923 ක් සාර්ථක ලෙස සිදුකර වංචනික වෙළඳුන්ට එරෙහිව අධිකරණයේ නඩු 14,906 ක් ගොනු කරන ලද අතර රුපියල් මිලියන 65 ට අධික දඩ පනවන ලදී.


රට තුළ ගුණාත්මකභාවයෙන් යුතු භාණ්ඩ පැවතීමේ අරමුණින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරයි. එමෙන් ම අධිකාරිය ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් නීති සම්පාදනය සහ පාරිභෝගික ආරක්ෂණය උදෙසා ප්‍රතිපත්තිමය වශයෙන් විශාල දායකත්වයක් ද දක්වා තිබේ.

කොවිඩ් තත්ත්වය තුළ දිවයින පුරා අගුලු දැමීම් මෙන් ම වරින් වර හුදකලාකිරීම් සිදුවුවද අප වෙත පාරිභෝගික පැමිණිලි 1978 ක් ලද අතර අධිකාරිය විසින් ලද පැමිණිලි වලින් විශාල ප්‍රමාණයකට විසඳුම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2020 වර්ෂය තුළ මාර්ගගත මිලදීගැනීම් සම්බන්ධ ප්‍රවණතාව සැලකියයුතු අන්දමෙන් ඉහළ ගිය අතර ඊට සමගාමීව මාර්ගගත වෙළඳාම සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව වැඩි විය. එබැවින්, මාර්ගගත මිලදී ගැනීම් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සකස් කිරීම අප විසින් ආරම්භ කළ අතර පාරිභෝගිකයින් සහ වෙළෙන්දන් වඩාත් හොඳ ආකාරයෙන් ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ පනත සංශෝධනය කරමින් පවතියි.

අපගේ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ මා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවකයන් සෑම අභියෝගයක් ම ජය ගැනීමට කටයුතු කරන ආකාරය නිරන්තරයෙන් ඇගයීමට ලක් කළෙමි. ගෝලීය වසංගතය හමුවේ පාරිභෝගිකයාට අපගේ සේවය වඩාත් අවශ්‍ය වූ පසුගිය වසර තුළ සියලු අභියෝග බාරගනිමින් කැපවීමෙන් යුතුව කටයුතු කිරීම සම්බන්ධයෙන් අපගේ ස්තුතිය ඔවුන් වෙත හිමි විය යුතු ය.

එමෙන්ම ගරු. වෙළඳ අමාත්‍ය සහ ගරු.සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමාට සහ අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරුන් වෙත ඔවුන්ගෙන් ලද අගනා උපදෙස්, දිරිගැන්වීම සහ මාර්ගෝපදේශ වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.



**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක**
සභාපති

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

**ආයතනික ඉලක්ක**

1) වෙළෙඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම.
2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම.
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම.
4) තරඟ විරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සැපයුම්කරුවන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය කිරීම.
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

**ආයතනික සාරධර්ම**

- විශ්වසනීයත්වය

  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම හා විශ්වසනීයත්වය තහවුරු කිරීම.

- අවංකභාවය හා ඍජුභාවය

  සියලුම කාර්යයන්හි දී අවංකවීම, සාධාරණ වීම සහ යුක්තිගරුකවීම.

- වගකීමට බැඳී සිටීම

  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.

- කණ්ඩායම් හැඟීම ගරු කිරීම

  අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සඳහා මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින්පොදු ඉලක්කයන් ළඟා කරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.

- ප්‍රසාදය පළ කිරීම

  සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම.

- අරමුණු ළඟාකර ගැනීම සඳහා කැපවීම

  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම.

- විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම

  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම.

- නිර්මාණශීලීත්වය සහ නව ක්‍රමෝපායයන් භාවිතයට ගැනීම

  සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම.

1 වන සහ දෙවන මහළ

සතොස මහලේකම් කාර්යාල

ගොඩනැඟිල්ල

අංක. 227, වොක්ෂොල් වීදිය

කොළඹ 02

2021.12.10

ගරු සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා,

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි,

1971 අංක 3 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, විගණිත ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් වාර්තාව සහ විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික)**
**සභාපති**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව -2020


| පටුන | පිටුව |
|---|---|
| 1. අප ගැන | |
| 1.1 හැඳින්වීම - - - - - - - - - | 01 |
| 1.2 අධිකාරිය පිහිටුවීම - - - - - - - - | 01 |
| 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය - - - - - - | 02 |
| 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - - - | 02 |
| 2. අධිකාරියේ අරමුණු - - - - - - - | 03 |
| 3. අධිකාරියේ කාර්යභාරය - - - - - - - - | 03-04 |
| 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය/ - - - - පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව-2020 | 04-18 |
| 4. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - - | 19-20 |
| 5. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - | 21 |
| 6. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය - - | 22-30 |
| 7. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව - | 31-38 |
| 8. විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් - - - - | 39-40 |

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළඳ පිළිවෙත් වලට එරෙහිව වෙළඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තව ද හැකි සෑම අවස්ථාවකදීම මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟකාරීත්වයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරිය පිහිටුවීම

පනතෙහි විධිවිධාන අනුව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතෙහි විශේෂයෙන් දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන දහයකට නොඅඩු සංඛ්‍යාවක් වන සාමාජිකයින්ගෙන් ද සමන්විත වේ.

**<u>අධිකාරියේ සාමාජිකයන්</u>**

2020 වර්ෂය අවසාන වන විට තනතුරු දරන සාමාජිකයන් ගේ නම් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| 1. | මේජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික) | සභාපති |
| 2. | සාලිය සරත් කුමාර මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 3. | ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ බස්නායක | පූර්ණ කාලීන සාමාජික |
| 4. | තුෂාන් ගුණවර්ධන මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 5. | පී.එම්.කේ.හෙට්ටිආරච්චි මහතා | භාණ්ඩාගාර නියෝජිත |
| 6. | ආචාර්ය ජේ. චන්දික සනත් මහතා | සාමාජික |
| 7. | ලංකාප්‍රිය අබේවර්ධන මහතා | සාමාජික |
| 8. | ආර්. සිසිරනාත් අධිකාරි මහතා | සාමාජික |
| 9. | එම්.එස්.වී.ලක්ෂ්මන් සමරවීර මහතා | සාමාජික |
| 10. | එම්.ඩබ්ලිව්.ඒ.සී.විජේසූරිය මහතා | සාමාජික |
| 11. | විරාජ් හර්ෂණ පෙරේරා මහතා | සාමාජික |
| 12. | එස්.ඒ මහින්ද ලාල් ගුණතිලක මහතා | සාමාජික |

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

මේජර් ජනරාල් ඩී.එම් ශාන්ත දිසානායක (විශ්‍රාමික) 2019.12.20 සිට අඛණ්ඩව සභාපති ධූරය දරන ලදී. එම්.එස්.එම්.ෆවුසර් මහතා 2018.09.14 දින සිට 2020.02.13 දක්වා ද ජේ.එම්.එස්.එන්.ජයසිංහ මහතා 2020.02.14 සිට 2020.09.30 දක්වාද අධ්‍යක්ෂ ජෙනරාල් ධූරය දරන ලද අතර 2020.10.02 සිට ඩී.එම්.එස්.දිසානායක මහතා අඛණ්ඩව එම ධූරය දරනු ලැබේ.

**අධිකාරියේ අංශ ප්‍රධානීන්**

| | |
|---|---|
| 1. **දීප්ති තිසේරා මිය**<br>රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ( පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය) - ශ්‍රී ජ'පුර විශ්වවිද්‍යාලය<br>අධ්‍යක්ෂ - නීති සහ බලගැන්වීම් | 2. **ඩබ්ලිව්.ඒ.කේ. බණ්ඩාර මහතා**<br>B.Sc (Valuation) Sp.<br>අධ්‍යක්ෂ – පාරිභෝගික කටයුතු සහ තොරතුරු<br>2019.10.01 වන දින සිට |
| 3. **සමන්තා කරුණාරත්න මිය**<br>ආර්ථික විද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි, ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධි<br>අධ්‍යක්ෂ -තරඟකාරීත්ව ප්‍රවර්ධන<br>2019.10.01 වන දින සිට | 4. **සම්පත් අඟුළුගහ මහතා,**<br>වාණිජවේදී (විශේෂ) ගෞරව උපාධි ,<br>MBA, MIM (SL),AIPM(SL), AUKAP, PG Dip in Pers & HRM, Dip in PM<br>අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන |
| 5. **ඩබ්ලිව්.එම්. ප්‍රියන්ත මහතා**<br>MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM<br>අධ්‍යක්ෂ - මූල්‍ය | 6. **නිරංජලා ජෙගනාදන් මිය,**<br>ACA, MBA (J'pura)<br>අධ්‍යක්ෂ - මිලකරණ සහ කළමනාකරණ |
| 7. **රසිකා සාවිත්‍රි විජේසේකර මිය**<br>ගණකාධිකරණ විද්‍යාවේදී (විශේෂ) උපාධි, ශ්‍රී. ජ'පුර විශ්වවිද්‍යාලය., CBA, MAAT<br>අභ්‍යන්තර විගණක | |

## 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

වාණිජ, නීතිය, ව්‍යාපාරික, ව්‍යවසාය කළමනාකරණය, වෙළඳ ප්‍රතිපත්ති සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත විශේෂඥවරුන් තිදෙනෙකුගෙන් සමන්විතව මෙම සභාව පිහිටුවන ලදී. මෙම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමු කරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගත යුතු ය. තව ද පනතෙහි 3 වන වගන්තිය යටතේ තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධ පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සහ තීරණ ගැනීම, 19 වන වගන්තිය යටතේ උපරිම සිල්ලර මිල නියම කිරීම සහ 19 වන සහ 20 වන වගන්ති යටතේ අනිසි මිල ගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම පිළිබඳ වගකීමට සභාව බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

එම්.එස්.එම්. සම්සුදීන් මහතා - සභාපති

එච්.විජේවර්ධන මහත - සභාපති

රංගිකා කොණ්ඩාරගමගේ මිය (නීතිඥ) - සභා ලේකම් - 01.08.2019 - 12.01.2020

## 2. අධිකාරියේ අරමුණු

අ. පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපළ වලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළඳ පිළිවෙත් වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල සහතික වීම.

ඇ. හැකි සෑම විම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම.

ඈ. අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහන ලබා දීම.

## 3. අධිකාරියේ කාර්යභාරය

1) අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

   අ. ව්‍යවසාය අතර සීමාකාරී වෙළඳ ගිවිසුම්

   ආ. ව්‍යවසායයන් අතර මිළ පිළිබඳ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම

   ඇ. වෙළඳපොළ ඇතුළත හෝ වෙළඳපොලේ දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම; හෝ

   ඈ. අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහන ලබාදීම.

2) තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදුකිරීම.

3) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම.

4) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

5) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

6) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.

7) වෙළඳපොළ තරඟකාරීත්වය අඩු ඵලදායීත්වයෙන් පවතින අවස්ථාවලදී වෙළඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම.

8) වෙළඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම.

9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.
11) වෙළඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.
12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම.
13) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.
14) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම; සහ
15) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්වත්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු ඉටුකිරීම.

**4. පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය**

ආයතනික ව්‍යුහය අනුව අධිකාරිය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙක් යටතේ පාලනය වන අංශ 6 කින් සහ අභ්‍යන්තර විගණන අංශයකින් සමන්විත වේ. එනම්;

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය
2) නීති සහ බලගැන්වීම් අංශය
3) මිලකරණ සහ කළමනාකරණ අංශය
4) තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය
5) මුදල් අංශය
6) මානව සම්පත් සහ පරිපාලන අංශය
7) අභ්‍යන්තර විගණන අංශය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 වර්ෂය සඳහා වන කාර්යසාධනය පහත දැක්වේ.

**1. හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම**

අ. පනතෙහි 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන

**විධාන අංක 72:** දේශීයව නිපදවන සහල් හෝ වී, සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා කෙළින් ම භාවිතා කිරීම හෝ අන්‍යාකාරයකින් සත්ත්ව ආහාර නිපදවීම සඳහා යෙදවුමක් ලෙස භාවිතා කිරීම සඳහා හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, තොග රැස්කර තැබීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම හෝ මිලදී ගැනීම නොකළ යුතු බවට සියලුම නිෂ්පාදකයන්, වෙළඳුන් සහ බෙදාහරින්නන් වෙත මෙයින් විධානය කරනු ලැබේ.

**විධාන අංක 73 :** සියලුම නිෂ්පාදකයින්, ආනයනකරුවන් සහ වෙළෙන්දන් විසින් උපලේබනයේ සඳහන් තොරතුරු ත්‍රෛභාෂාවෙන් ම මුද්‍රණය කළ යුතු ය (2019.12.31 දිනැති අංක 2156/16 දරන ගැසට් නිවේදනය අවලංගු කරන ලදී)

**විධාන අංක 74:** අත් පිරිසිදුකාරක සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අනිවාර්ය වේ.

**අ. පනතෙහි 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද / ඉවත් කරන ලද නියෝග**

**නියෝග අංක 58** : 2016.07.14 දිනැති අංක 1975/68 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙහි බී ළූණු යන අයිතමය මෙයින් ඉවත් කරනු ලබන අතර බී ළූණු සඳහා උපරිම සිල්ලර මිලක් තීරණය කරනු ලැබේ.

**නියෝග අංක 59 –** බ්‍රොයිලර් කුකුළු මස් සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

**නියෝග අංක 60 –** බඩ ඉරිඟු සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

**නියෝග අංක 61 –** මයිසූර් පරිප්පු, බී ළූණු සහ ටින්කළ මාළු සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

2017.12.06 දිනැති අංක 2018/30 දරන අංක 48 නියෝගයේ මයිසූර් පරිප්පු යන අයිතමය ඉවත් කිරීම. 2020.02.24 දිනැති අංක 2164/7 දරන අංක 58 නියෝගයේ බී ළූණු යන අයිතමය ඉවත් කිරීම. 2016.07.14 දිනැති අංක 197568 දරන අංක 39 නියෝගයේ ටින්කළ මාළු යන අයිතමය ඉවත් කිරීම.

**නියෝග අංක 62** - සහල් වර්ග කිහිපයක උපරිම සිල්ලර මිල නියම කිරීම

2019.12.19 දිනැති අංක 2154/19 ගැසට් පත්‍රයේ සඳහන් අංක 5 නියෝගය අවලංගු කිරීම.

**නියෝග අංක 63** - කහ කුඩු සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

**නියෝග අංක 64 –** නියෝග අංක 52 සහ 53 අවලංගු කරන ලදී (සීනි සඳහා උපරිම සිල්ලර මිල - 2018.10.12)

**නියෝග අංක 65 –** "මයිසූර් පරිප්පු" සහ "ටින් කළ මාළු" 2020.03.17 දිනැති අංක 61 දරන නියෝගයෙන් ඉවත් කිරීම.

**නියෝග අංක 66** - විවිධ වර්ගයේ සහල් සඳහා උපරිම සිල්ලර මිල (2020.04.10 දිනැති අංක 2 දරන නියෝගය අවලංගු කරන ලදී.

**නියෝග අංක 67 –**ඩෙංගු සඳහා වන ප්‍රතිදේහජනක පරීක්ෂණය (NSE Antigen Test for Dengue) සහ පූර්ණ රුධිර ගණන පරීක්ෂණය ( Full Blood Count) සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම.

**නියෝග අංක 68 –** 2020.04.21 දිනැති අංක 2172/5 දරන නියෝග අංක 63 (කහ කුඩු) අවලංගු කිරීම.

**නියෝග අංක 69** - පොල් සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

**නියෝග අංක 70** - සහල් නිෂ්පාදකයන්ට සහ මෝල් හිමියන්ට සහල් සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

නියෝග අංක **71** - සුදු සීනි උපරිම සිල්ලර මිල නියම කිරීම

අ. **ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ දිවයිනට ඇතුළුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. එබඳු සිද්ධීන් අධිකාරිය විසින් විමර්ශනය කරන ලද අතර ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රති අපනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශ කරන ලදී.

ආ. **ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති/ නීති හඳුන්වාදීම**

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා දී සහාය දක්වයි.

අ. **වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම**

අ. ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

තරඟකාරීත්වය ප්‍රවර්ධනය සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ සිවිල් සමාජ සහභාගීත්ව වැඩසටහන් මඟින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ බලය ලබාදීම සිදු කරනු ලැබේ. සැලසුම් කරන ලද ව්‍යාපාරික දැනුවත්කිරීම් වැඩසටහන් ඔස්සේ මෙය ක්‍රියාත්මක කරන ලදී.

2020 වර්ෂයේදී ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 88 ක් ක්‍රියාත්මක කරන ලදී.

**වගු අංක – 1** – 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්

| පළාත | දිස්ත්‍රික්කය | ව්‍යාපාරික දැනුවත්කිරීමේ වැඩසටහන් වැඩසටහන් |
|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 09 |
| | මාතලේ | - |
| | නුවරඑළිය | 07 |
| නැගෙනහිර පළාත | අම්පාර | 01 |
| | මඩකලපුව | 01 |
| | ත්‍රිකුණාමලය | - |
| උතුරු මැද පළාත | අනුරාධපුර | 11 |
| | පොළොන්නරුව | - |
| උතුරු පළාත | යාපනය | 01 |
| | කිළිනොච්චි | 05 |
| | මන්නාරම | 07 |
| | මුලතිව් | 02 |
| | වව්නියාව | 05 |
| වයඹ පළාත | කුරුණෑගල | 10 |
| | පුත්තලම | - |
| සබරගමුව පළාත | කෑගල්ල | 01 |

| | | |
|---|---|---|
| | රත්නපුර | 06 |
| දකුණු පළාත | ගල්ල | - |
| | හම්බන්තොට | - |
| | මාතර | - |
| ඌව පළාත | බදුල්ල | 01 |
| | මොනරාගල | 16 |
| බස්නාහිර පළාත | කොළඹ | - |
| | ගම්පහ | 03 |
| | කළුතර | 02 |
| **මුළු සංඛ්‍යාව** | | **88** |

ආ. වෙළඳපොළෙහි සිදුකරන ලද වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතෙහි විධිවිධාන අනුව ලේබලයෙහි උපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම, භාණ්ඩයේ සඳහන් මිලට වඩා වැඩි මිලකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සන්තකයෙහි තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම, අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම, මිල දර්ශන ප්‍රදර්ශනය නොකිරීම, මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟ යැවීම හෝ වංචාකාරී කටයුතු සිදුකිරීම හෝ නිෂ්පාදකයින්/වෙළඳුන් විසින් සිදුකරන ලද ව්‍යාජ නියෝජන වැටලීමට ලක්කිරීම සහ විමර්ශනය කිරීම, වංචාකාරී වෙළඳුන්ට අදාළව පනතෙහි 60 වන වගන්තියෙහි විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

**වගු අංක 2 - වෙළඳපොළ වැටලීම් සහ දඩ මුදල් නියම කිරීම් වල ප්‍රගතිය**

| සිදු කරන ලද ක්‍රියාකාරකම් | වැටලීම් සංඛ්‍යාව | අවස්ථා සංඛ්‍යාව | නියම කරන ලද දඩ මුදල් (රු.) |
|---|---|---|---|
| වෙළඳපොළ වැටලීම් සහ විමර්ශන | | | |
| - 10 වන වගන්තිය යතේ වෙළඳපොළ විමර්ශන (10 වන වගන්තිය යටතේ දක්වන ලද විධාන උල්ලංඝණය කිරීම) | 5,381 | 5,167 | 26,159,300 |
| - 11 වන වගන්තිය යටතේ වෙළඳපොල විමර්ශන (භාණ්ඩයේ සඳහන් මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම) | 166 | 124 | 630,000 |
| - 12 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | 259 | 272 | 1,623,500 |
| - 15 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන | 24 | 33 | 127,000 |
| - 16 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන ඕනෑම භාණ්ඩයක් සන්තකයේ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම) | 32 | 40 | 266,500 |
| - 17 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (භාණ්ඩ සඟවා තබාගැනීම) | 02 | - | - |
| - 18 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (උපරිම සිල්ලර මිල පවත්වාගෙනයාම උල්ලංඝනය කිරීම) | 08 | 16 | 78,500 |

| | | | |
|---|---|---|---|
| - 20 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන | 2,362 | 2,005 | 8,265,600 |
| - 26 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම) | 5,184 | 4,763 | 14,207,400 |
| - 28 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (වෙළෙන්දන් විසින් මිලදී ගන්නන් වෙත කුවිතාන්සි නිකුත් කිරීම) | 15 | 09 | 22,500 |
| - 30 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (නොමඟයැවීම සහ වංචාකාරී කටයුතු) | 1,653 | 1,551 | 8,884,700 |
| - 30 සහ 31 වන වගන්ති යටතේ වෙළඳපොළ විමර්ශන (නොමඟ යැවීම සහ ව්‍යාජ නියෝජන) | 756 | 808 | 4,616,300 |
| 31 වන වගන්තිය යටතේ වෙළඳපොළ විමර්ශන (ව්‍යාජ නියෝජන) | 81 | 118 | 597,500 |
| මුළු වැටලීම් සංඛ්‍යාව සහ අය කරන ලද දඩ මුදල | **15,923** | **14,906** | **65,478,800** |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන ලද විශේෂ වැටලීම්**

01. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශයේ අනුමැතියෙන් තොරව විවිධ ආයතන සහ වෙළඳ සන්නාමයන් යටතේ වෙළඳපොළට නිකුත් කරනු ලබන නීති විරෝධි බාල වර්ගයේ ලිහිසි තෙල් නිෂ්පාදන අත්අඩංගුවට ගැනීමේ වැටලීම් කටයුතු දීප ව්‍යාප්තව 2020.02.17 වන දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරනු ලැබූ අතර රුපියල් ලක්ෂ 25 කට ආසන්න නීති විරෝධී ලිහිසි තෙල් නිෂ්පාදන අත්අඩංගුවට ගනු ලැබීය.



02. Hiru CIA මගින් ලැබුණු තොරතුරක් මත වත්තල හැදල ප්‍රදේශයේ පිහිටි මදීනා ෆුඩ්ස් පුද්ගලික සමාගම විසින් කේක් නිෂ්පාදනය කිරීමේදී කල් ඉකුත් වූ අමුද්‍රව්‍ය යොදා ගැනීම හේතුවෙන් ගම්පහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි ඒකකය මගින් විශේෂ වැටලීමක් 01.02.2020 වන දින සිදු කරන ලදී. කල් ඉකුත් වූ කේක් අමුද්‍රව්‍ය ටොන් 17ක් විනාශ කිරීම සඳහා යොමු කළ අතර නීතිමය පියවර ගනිමින් පවතියි.




03. අනවසරයෙන් මෙරටට ගෙන්වන ලද ප්‍රමිතියෙන් තොර මුහුණු ආවරණ වැටලීම් 30.01.2020 සහ 31.01.2020 දෙදින තුළ සිද කරනු ලැබූ අතර වෙළඳසැල් හිමිකරුවන්ට දඩ මුදල් නියම කරනු ලැබූ අතර අදාළ මුහුණු ආවරණ තොගය විනාශ කිරීම සඳහා නියම කරන ලදී.








04. 2020.02.20 දින තත්ත්වයෙන් බාල මිරිස් තත්ත්වයෙන් උසස් මිරිස් සමඟ මිශ්‍ර කිරීම සඳහා කටයුතු සිදු කරමින් සිටියදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මඟින් වැටලීමට ලක් කරනු ලැබීය. මෙහිදී තත්ත්වයෙන් බාල මිරිස් කි.ග්‍රෑ. 25 යුතු බෑග් 25 ක් පමණ අත්අඩංගුවට ගනු ලැබීය.


05. භාවිතා කරනු ලැබූ පාම් තෙල් ලීටර් 200 ක් කොළඹ 11 ප්‍රදේශයේ දී විකිණීමට ඉදිරිපත් කර තිබියදී 17.02.2020 වන දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මඟින් වැටලීමක් සිදු කරන ලදී.




<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරන ලද වැටලීම්</u>




<u>පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ මුදල්</u>



**2.** **අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම**

අ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පාරිභෝගික අධිකාරී පනතෙහි 13 වන සහ 32 වන වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකය සම්බන්ධ කරුනු හෝ වෙනත් දෑ සමඟ අනුකූල වන ලෙස භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශන කළ හැකි ය.

2020 වර්ෂයේ දී පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන් ලද ප්‍රගතිය 3 වන වගුවේ දැක්වේ.

**වගු අංක – 3 පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම**

| | **මුළු සංඛ්‍යාව** |
|---|---|
| ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 1978 |
| (අ) තැපෑලෙන් | 1978 |
| වැටලීම් ( ප්‍රධාන කාර්යාලය / දිස්ත්‍රික් කාර්යාල) | 1052 |
| වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි | 453 |
| විමර්ශන සඳහා යොමු කරන ලද පැමිණිලි | 31 |
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා හා විමර්ශන වලට පෙර පවත්වන ලද සාකච්ඡා | 846 |
| සාකච්ඡා කිරීමෙන් අනතුරුව විසඳන ලද අවස්ථා | 317 |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ඇතුළත්ව)

**අධිකරණයේ ගොනු කරන ලද නඩු**

| නඩු වර්ගය | **වර්ෂය** |
|---|---|
| නීති සහ බලාත්මක කිරීමේ අංශය විසින් ගොනු කරන ලද නඩු | 14 |
| අධිකරණයේ පෙනීසිටීම | 288 |
| දඩ මුදල් (අධිකරණයේ නඩු ගොනුකිරීම හේතුවෙන් ලැබෙන) | රු. 211,000.00 |

## 3. පාරිභෝගික අධ්‍යාපනය සහ බලගැන්වීම පාරිභෝගික දැනුවත්කිරීමේ වැඩසටහන්

### අ. පාරිභෝගික දැනුවත්කිරීමේ වැඩසටහන්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන ආදිය මඟින් පාරිභෝගික අයිතීන් සහ වගකීම, වර්තමාන පාරිභෝගික නීතිය, යහපත් ව්‍යාපාරික පිළිවෙත් ආදිය පිළිබඳව දැනුවත් කරනු ලැබේ.

පාරිභෝගික අයිතිවාසිකම් දිනය, පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ එක්ව සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතෙහි නීති රීති සම්බන්ධයෙන් දිවයින පුරා දැනුවත්කිරීමේ වැඩසහන් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 5 - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙහෙයවන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්

| පළාත | දිස්ත්‍රික්කය | සාමාන්‍ය ජනතාව දැනුවත්කිරීම් | පාසැල් සිසුන් දැනුවත්කිරීම් |
|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 08 | 01 |
| | මාතලේ | 02 | - |
| | නුවරඑළිය | 07 | 02 |
| නැගෙනහිර පළාත | අම්පාර | 21 | 10 |
| | මඩකලපුව | 18 | 18 |
| | ත්‍රිකුණාමලය | | |
| උතුරු මැද පළාත | අනුරාධපුර | 01 | 07 |
| | පොළොන්නරුව | 02 | 01 |
| උතුරු පළාත | යාපනය | 12 | 04 |
| | කිළිනොච්චිය | 09 | 03 |
| | මන්නාරම | 02 | 04 |
| | මුලතිව් | 01 | 04 |
| | වව්නියාව | 02 | 02 |
| වයඹ පළාත | කුරුණෑගල | 11 | 02 |
| | පුත්තලම | 05 | 03 |
| සබරගමුව පළාත | කෑගල්ල | 03 | 01 |
| | රත්නපුර | 08 | - |
| දකුණු පළාත | ගල්ල | 05 | 02 |
| | හම්බන්තොට | 04 | - |
| | මාතර | 01 | 01 |
| ඌව පළාත | බදුල්ල | 01 | 06 |
| | මොනරාගල | 10 | - |
| බස්නාහිර පළාත | කොළඹ | 06 | 06 |
| | ගම්පහ | 02 | - |
| | කළුතර | 01 | 03 |
| **මුළු සංඛ්‍යාව** | | **147** | **85** |

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්</u>






පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාසල් හා වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කටයුතු සිදු කරන ලදී.

**4.** වෙළෙන්දන් සහ නිෂ්පාදකයින් ප්‍රති තරඟකාරී කටයුතු වලින් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම

| ක්‍රියාකාරකම | මුළු සංඛ්‍යාව |
|---|---|
| <u>වෙළඳ පැමිණිලි පිළිබඳ විමර්ශන</u><br>ප්‍රති තරඟකාරී මෙන්ම අසාධාරණ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමු කළ පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම<br>• පූර්ව කාලය තුළ යොමු කරන ලද පැමිණිලි<br>• අදාළ කාලය තුළ යොමු කරන ලද පැමිණිලි<br>• සභාව වෙත යොමු කරන ලද පැමිණිලි<br>• වර්ෂය තුළ ඉවත් කරන ලද පැමිණිලි<br>• දැනට කටයුතු කරනු ලබන පැමිණිලි | 18<br>23<br>-<br>12<br>29 |
| <u>පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සියලු දෙනාට සාධාරණ පිළිවෙතක් අනුගමනය කිරීම</u><br>2007/07/11 දින නිකුත් කළ අංක 1505/15 දරන ගැස් නිවේදනය මඟින් හඳුනා ගන්නා ලද නිෂ්පාදන පහක් සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම<br>• ලද අයදුම්පත් සංඛ්‍යාව<br>• ක්‍රියා කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 212<br>212 |
| <u>ආහාර ද්‍රව්‍ය වල මිල පරීක්ෂා කිරීම - වාර්තා සංඛ්‍යාව</u><br>එළවළු වල දෛනික සිල්ලර මිල පිළිබඳ වාර්තා<br>අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිළ ගණන් පිළිබඳ වාර්තා<br>අත්‍යවශ්‍ය මිල වාර්තා | 50<br>50<br>65 |
| පර්යේෂණ අධ්‍යයනය<br>විශේෂ අධ්‍යයනය | 02<br>- |
| දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 02 |
| 1977අන්තර් ක්‍රියාකාරීත්ව ජංගම සේවය | සතියකට දින තුනක් පදනම (5*60*3) + ආයතන 15 |

**<u>අන්තර් ක්‍රියාකාරීත්ව ජංගම දුරකථන ප්‍රතිචාර සේවය (1977)</u>**

අන්තර් ක්‍රියාකාරීත්ව ජංගම දුරකථන ප්‍රතිචාර සේවය තුළින් පුරවැසියන් වෙත සිල්ලර මිල තොරතුරු (කෙටි කේතාංකය 1977) ලබා දෙනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළදී ස්වකීය කෙටි කේතාංක දුරකථන අංකය වන 1977 භාවිතා කර සිල්ලර වෙළඳපොළ (කොළඹ, පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත) තුළ එළවළු, පළතුරු සහ ආහාර ද්‍රව්‍ය සිල්ලර මිල ගණන් දෛනිකව මෙම දුරකථන පද්ධතියට අඛණ්ඩව ඇතුළත් කරන ලදී. පැලියගොඩ මාළු වෙළඳපොලෙන් මාළු මිල ගණන් ලබා ගැනේ. මෙම තොරතුරු දෛනිකව පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. මෙමඟින් පාරිභෝගිකයන්ට තමන් මිලදී ගන්නා භාණ්ඩ පිළිබඳව දැනුවත්භාවයෙන් යුතුව තීරණය කළ හැකිය.

**වෙනත් නියාමන අධිකාරීන් සහ පාර්ශවකාර සංවිධාන අතර ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම හා පවත්වා ගැනීම**

1. ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති උපදේශන කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
2. කළමනාකරණ පද්ධති සහතිකකරණ කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
3. ශ්‍රී ලංකාව තුළ පොලිතීන් සහ ප්ලාස්ටික් භාවිතය තහනම් කිරීම හා පාලනය බලාත්මකකිරීම ශක්තිමත් කිරීම සඳහා වන කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
4. ශ්‍රී ලංකාවේ මනා පරිසර කළමනාකරණය සහ පොලික්ලෝරිනීකෘත බයිෆීනයිල් (PCBs) අපද්‍රව්‍ය සහ PCB මඟින් දූෂිත/අන්තර්ගත උපකරණ බැහැර කිරීම පිළිබඳ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
5. HCFC- මොන්ට්‍රියල් ක්‍රමලේඛය භාවිතය නැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අතිරේක රෙගුලාසි හඳුන්වාදීම පිළිබඳ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
6. ශ්‍රී ලංකාව තුළ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිෂ්පාදක/වෙළඳ සහ පාරිභෝගික වගකීම යන මූලධර්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
7. ශ්‍රී ලංකාවේ කාර්මික රසායනික කළමනාකරණය සඳහා තාක්ෂණික උපදේශන කමිටුව -මධ්‍යම පරිසර අධිකාරිය
8. බැසෙල්, රොටර්ඩෑම්, ස්ටොක්හෝම් සහ මිනාමේටා සමුළු පිළිබඳ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
9. ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යුත් කාර්මික කමිටුව – ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
10. ජාතික රසායනාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ පාර්ශවකාර සමිතිය - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
11. හිස් ආවරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමිතීන් සංශෝධනය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
12. රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද කාර්යසාධන විගණන වාර්තාව මත පදනම් වූ ජාතික විද්‍යුත් කළමනාකරණ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
13. රසායනික අනතුරු වැළැක්වීම සහ පෙර සූදානම් කමිටුව - මධ්‍යම පරිසර අධිකාරිය
14. බැසෙල් සමුළුව ක්‍රියාත්මකකිරීම පිළිබඳ තාක්ෂණික විශේෂඥ කමිටුව - මධ්‍යම පරිසර අධිකාරිය
15. ජාතික පෝෂණ ප්‍රතිපත්තිය පිළිබඳ කමිටුව - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
16. ජීවන වියදම් කමිටු රැස්වීම - මුදල් අමාත්‍යාංශය
17. ආහාර උපදේශන කමිටුව - සෞඛ්‍ය අමාත්‍යාංශය

**සාධාරණ මිලකරණය සහතිකකිරීම**

**අ. නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය**

පනතෙහි 18, 19, සහ 20 වගන්ති මඟින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හඳුනාගත් භාණ්ඩවල වෙළඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි. තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියම කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත අංක 7 වගුව මඟින් දැක්වේ.

**වගු අංක 7 - තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|
| ගෑස් | ගෑස් අයදුම්පත් සම්බන්ධයෙන් තීරණ ලබාදී නොමැත. |
| සිමෙන්ති | සිමෙන්ති අයදුම්පත් 09 සඳහා තීරණ ලබා දී තිබේ. |
| යොදය සහිත කිරිපිටි | යොදය සහිත කිරිපිටි අයදුම්පත් 09 ක් සඳහා තීරණ ලබා දී තිබේ. |
| මේද රහිත කිරිපිටි | මේද රහිත කිරිපිටි සම්බන්ධයෙන් තීරණ ලබා දී නොමැත. |
| ළදරු කිරිපිටි | ළදරු කිරිපිටි අයදුම්පත්‍රයක් සඳහා තීරණ ලබා දී තිබේ. |
| තිරිඟු පිටි | තිරිඟුපිටි අයදුම්පත්‍ර සඳහා තීරණ ලබා දී නොමැත. |
| ටින්කළ මාළු | ටින්කළ මාළු අයදුම්පත්‍ර 02 ක් සඳහා තීරණ ලබා දී ඇත. |

**ලද අයදුම්පත් සංඛ්‍යාව**

| අයිතම | ලද අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 10 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි<br>ළදරු කිරිපිටි<br>මේද රහිත කිරිපිටි | 09<br>01<br>- |
| ගෑස් | - |
| තිරිඟුපිටි | - |
| ටින් කළ මාළු | 04 |

**නිකුත් කරන ලද අතුරු නියෝග සංඛ්‍යාව**

| අයිතම | ලද අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 08 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි<br>ළදරු කිරිපිටි<br>මේද රහිත කිරිපිටි | 01<br>-<br>01 |
| තිරිඟුපිටි | - |
| ටින් කළ මාළු | 03 |

අ. ආයතනයේ ශක්‍යතා සංවර්ධනය

**ආ. කාර්ය මණ්ඩල සංවර්ධනය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සේවකයින් අදාළ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය ලබා තිබීම ස්වකීය සේවාවන් ඉහළ නැංවීම සඳහා දායකත්වය සපයන ආයෝජනයක් වශයෙන් සලකනු ලැබේ. **2020** වර්ෂයේ දී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගු අංක - 8 මඟින් දැක්වේ.

**වගු අංක – 8 – 2020 වර්ෂයේ දී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසහන්**

| # | පුහුණු වැඩසටහන | පැවැත්වුණු දිනය/ දින | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අවසන් සම්මන්ත්‍රණය | 2020-ජනවාරි 22 | 77 |
| 02 | හරස් පරීක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ප්‍රායෝගික පුහුණුව - සති 8) නීතිඥ සංගමය, ශ්‍රී ලංකාව | 2020 ජනවාරි 24 වන දින සිට සති 8 ක් | 02 |
| 03 | සේවා ස්ථානය තුළ ඉගෙනුම් හා ඉගෙනුම් නොවන ප්‍රවීණත්වය සහ විශේෂඥතාව පිළිබඳ වැඩමුළුව | 2020 පෙබරවාරි 27 | 01 |
| 04 | විනය පරීක්ෂණ පිළිබඳ පුහුණුව, PRAG ආයතනය | 2020 මාර්තු 12 | 03 |
| **මුළු සංඛ්‍යාව** | | | **83** |

**ආ. අධිකාරියේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම**

| තනතුර | වැටුප් කේතාංකය | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | තාවකාලික/ කොන්ත්‍රාත් | |
| **ජ්‍යෙෂ්ඨ කළමනාකරණ** | | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | **HM 2-1** | **1** | **1** | **0** | **0** |
| අධ්‍යක්ෂවරුන්/ පාරිභෝගික සභාවේ ලේකම් | **HM 1-1** | **7** | **6** | **0** | **1** |
| **කළමනාකරණ** | | | | | |
| අභ්‍යන්තර විගණක | **MM 1-1** | **1** | **1** | **0** | **0** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (නීති සහ බලගැන්වීම්) | | **12** | **0** | **0** | **2** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (පරිපාලන සහ මානව සම්පත්) | | | **1** | **0** | **1** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (මූල්‍ය) | | | **2** | **0** | **0** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (තරඟකාරීත්ව ප්‍රවර්ධන) | | | **1** | **0** | **1** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (මිලකරණ සහ ප්‍රවර්ධන) | | | **1** | **0** | **1** |

| | | | | | |
|---|---|---|---|---|---|
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (පාරිභෝගික කටයුතු සහ තොරතුරු) | | | **0** | **0** | **2** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ප්‍රාදේශීය අධ්‍යක්ෂවරුන් | | **12** | **6** | **0** | **6** |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සාමූහික සන්නිවේදන) - තවකාලික පදනම | | **1** | **0** | **0** | **1** |
| **කනිෂ්ඨ කළමනාකරණ** | | | | | |
| විගණන නිලධාරී | **JM 1-1** | **2** | **2** | **0** | **0** |
| පද්ධති පරිපාලක | | **1** | **1** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | | **27** | **27** | **0** | **0** |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී | | **1** | **0** | **0** | **1** |
| ජ්‍යෙෂ්ඨ වෙළඳ පර්යේෂණ විශ්ලේෂක | | **1** | **0** | **0** | **1** |
| ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | | **2** | **1** | **0** | **1** |
| රහස්‍ය ලේකම් (සභාපති) | | **1** | **1** | **0** | **0** |
| රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්) | | **1** | **0** | **0** | **1** |
| ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරී | | **1** | **0** | **0** | **1** |
| ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීමේ නිලධාරී | | **2** | **1** | **0** | **1** |
| ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී | | **1** | **1** | **0** | **0** |
| නීති බලගැන්වීමේ නිලධාරී | | **6** | **6** | **0** | **0** |
| **බලගැන්වීම්/ මෙහෙයුම්/ ව්‍යාප්ති** | | | | | |
| දත්ත සම්බන්ධීකාරක | **MA 5-2** | **1** | **0** | **0** | **1** |
| සංඛ්‍යාලේඛන නිලධාරී | | **1** | **1** | **0** | **0** |
| වෙළඳපොළ පර්යේෂණ විශ්ලේෂක | | **1** | **1** | **0** | **0** |
| ප්‍රලේඛන නිලධාරී II | | **6** | **3** | **0** | **3** |
| පුස්තකාලයාධිපති | | **1** | **1** | **0** | **0** |
| පිරිවැය නිලධාරී | | **15** | **2** | **0** | **9** |
| ගිණුම් නිලධාරී | | | **4** | **0** | |
| පරිපාලන නිලධාරී II | | **5** | **3** | **0** | **2** |
| විමර්ශන නිලධාරී | | **450** | **368** | **0** | **82** |
| මාධ්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත) | | **1** | **0** | **0** | **1** |
| **කළමනාකරණ සහකාර තාක්ෂණික** | | | | | |
| පොත් තබන්නා | **MA 2-2** | **1** | **0** | **0** | **1** |
| ඡායාරූප ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) | | **1** | **0** | **0** | **1** |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| කළමනාකරණ සහකාර | **MA 1-2** | **50** | **41** | **0** | **9** |
| කළමනාකරණ සහකාර (සරප්) | | **1** | **1** | | |
| **ප්‍රාථමික මට්ටම (පුහුණු)** | | | | | |
| රියදුරු | **PL 3** | **28** | **26** | **0** | **2** |
| **ප්‍රාථමික මට්ටම (නුපුහුණු)** | | | | | |
| කාර්යාල කාර්ය සහායක | **PL 1** | **24** | **21** | **0** | **3** |
| කාර්යාල කාර්ය සහායක (කොන්ත්‍රාත් පදනම මත) | | **1** | **0** | **0** | **1** |
| **Total -** | | **667** | **531** | **0** | **136** |

**ඇ. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සහ සුභසාධනය**

සේවකයන්ට ප්‍රසන්න මෙන් ම සේවයය හිතකර කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ආගමික හා සංස්කෘතික වැඩසටහන්, සේවක දිරිදීමනා ක්‍රමය, සේවක සංවර්ධන වැඩසටහන් සහ සේවක හඳුනාගැනීමේ වැඩසටහන් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ඈ. පාරිභෝගික කටයුතු පිළිබඳ පනත සඳහා සංශෝධන**

ගරු නීතිපතිතුමාගේ අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව**

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමු කිරීම් ප්‍රධාන වශයෙන් ප්‍රති-තරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිලගණන් , වෙළඳපොළ අඩුපාඩු සහ වෙළඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කටයුතු මෙන් ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත පැවරී තිබේ.

**පැමිණිලි / යොමුකිරීම**

| **ක්‍රියාකාරකම්** | **ප්‍රගතිය** |
|---|---|
| ජනතා අභිලාෂයට ප්‍රතිවිරුද්ධව ක්‍රියාත්මක වන ප්‍රතිතරඟකාරී ක්‍රියාකාරකම් සඳහා සහනය සැලසීම තහවුරු කිරීම | විසඳීමට ඇති 01 |
| භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිලක් නිර්දේශ කිරීම | 05 |
| අසාධාරණ මිල ගණන් සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම | 02 |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | 2020.12.31 | 2019.12.31 |
|---|---|---|
| | දිනට | දිනට |
| <u>වත්කම්</u> | රු. 000' | රු. 000' |
| **ජංගම වත්කම්** | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 64,709 | 74,663 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 31,905 | 35,667 |
| භාණ්ඩ තොගය/ තොග | 2,472 | 2,710 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 9,306 | 10,980 |
| | **108,392** | **124,020** |
| ක්‍රියාත්මක වන කාර්යයන් (සංවර්ධන පියවර) | - | 731 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 315,418 | 306,223 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම | 72,462 | 54,234 |
| ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය) | 12,343 | 17,800 |
| කුලී පදනමට ගත් ගොඩනැඟිලි | 750 | 775 |
| වත්කම්, පිරියත සහ උපකරණ | 64,837 | 82,688 |
| | **465,809** | **461,720** |
| **මුළු වත්කම්** | **574,202** | **586,470** |

| | | |
|---|---|---|
| <u>**වගකීම්**</u> | - | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වියදම් | 50,778 | 40,405 |
| ගෙවිය යුතු මුදල් සහ වෙනත් වගකීම් | 1,592 | 6,249 |
| | **52,370** | **46,654** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 84,141 | 79,620 |
| **මුළු වගකීම්** | **136,512** | **126,274** |
| **මුළු ශුද්ධ වත්කම්** | **437,690** | **460,197** |
| <u>**ශුද්ධ වත්කම්/ ස්කන්ධ**</u> | - | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | (4,339) | 14,241 |
| සංචිත | 378,837 | 382,764 |
| | **437,690** | **460,196** |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධ** | **437,690** | **460,196** |

මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පූර්ණ කොටසක් වේ. මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)
පාරිභෝගික කටයුතු පිළිබඳ
අධිකාරිය

අධ්‍යක්ෂ ජනරාල්
පාරිභෝගික කටයුතු පිළිබඳ
අධිකාරිය

සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ
අධිකාරිය

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | **2020.12.31** දිනට | **2019.12.31** දිනට |
|---|---|---|
| | **රු. 000'** | **රු. 000'** |
| **ආදායම** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 477,296 | 502,975 |
| දඩ මුදල් මඟින් ලද ආදායම් | 21,826 | 39,094 |
| වෙනත් ආදායම් | 61,278 | 67,223 |
| | **560,400** | **609,292** |
| **වියදම්** | | |
| පුද්ගල පඩිනඩි | (398,742) | (378,172) |
| ගමන් වියදම් | (10,189) | (13,589) |
| සැපයුම් සහ පරිභෝජන | (10,577) | (10,733) |
| නඩත්තු | (10,132) | (9,207) |
| ගිවිසුම්ගත සේවා | (56,524) | (64,704) |
| ක්ෂයවීම් | (23,080) | (32,123) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (32,726) | (43,206) |
| මූල්‍ය පිරිවැය | (194) | (204) |
| බෛරුම් කිරීම් | (22,163) | - |
| මුළු වියදම් | **(564,327)** | **(551,938)** |
| **පරිච්ඡේදය සඳහා මුළු ශුද්ධ අතිරික්තය/ (හිඟ මුදල)** | **(3,927)** | **57,354** |
| ප්‍රත්‍යාගණන ලැබීම් | - | 16,916 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | **(3,927)** | **74,270** |

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2020<br>රු.000' | 2019<br>රු. 000' |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාවලියෙන් ලද අතිරික්තය/ (හිඟය) | **(3,927)** | **57,354** |
| **ගැළපුම්** | | |
| වත්කම් අපහරණයෙන් ලැබීම් | - | 22 |
| ක්ෂවීම් | 23,080 | 32,123 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 5,180 | 13,602 |
| ක්‍රමක්ෂයවීම් | 25 | 25 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට ප්‍රථම මෙහෙයුම් ලාභය** | **24,358** | **103,126** |
| ගෙවීම් ඉහළයාම - සටහන I | 5,717 | (7,489) |
| වෙනත් ජංගම වත්කම් පහළයාම - සටහන II | 5,675 | (5,474) |
| පාරිතෝෂික ගෙවීම් | (659) | (1,909) |
| ක්‍රියාත්මක වන කාර්යයන් වැඩි වීම්/ අඩුවීම් | 731 | 138 |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **35,821** | **88,392** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| පිරියත සහ උපකරණ මිලදීගැනීම | (5,228) | (10,975) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (18,228) | (22,704) |
| ආයෝජන ඉහළයාම | (9,195) | (30,446) |
| දීර්ඝ කාලීන ණය අඩුවීම (කාර්ය මණ්ඩල ණය) | 5,456 | 570 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(27,195)** | **(63,555)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | | |

| | | |
|---|---:|---:|
| | 4,500 | 11,348 |
| ක්ෂවීම් | (23,080) | (32,124) |
| විලම්භිත ආදායම් | (18,580) | (20,776) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(18,580)** | **(20,776)** |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ ඉහළයාම/ (අඩුවීම)** | **(9,954)** | **4,061** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **74,663** | **70,602** |
| **කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **64,709** | **74,663** |

## 2020.12.31 දිනට ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

**රු.'000**

| විස්තරය | ආස්තිත්‍යයේ හිමිකරුවන්ට අරෝපණය කළ හැකි | | | |
|---|---|---|---|---|
| | දායකත්ව ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය/ ඌනතාවය | ප්‍රත්‍යාගණන අතිරික්තය | මුළු ශුද්ධ වත්කම්/ හිමිකම් |
| **2020/01/01 දිනට ශේෂය** | **14,241** | **415,927** | **16,916** | **447,084** |
| ප්‍රති ඇස්තමේන්තුගත ලාභය (2019) | | 13,113 | | **13,113** |
| **සංශෝධිත ශේෂය** | **14,241** | **429,040** | **16,916** | **460,197** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම් 2020** | | | | |
| භාණ්ඩාගාර දායකත්වය (ප්‍රාග්ධන) | 4,500 | | | **4,500** |
| විලම්භිග ආදායම ක්‍රමක්ෂය වීම | (23,080) | | | **(23,080)** |
| වර්ෂය සඳහා අතිරික්තය/ හිගය | | (3,927) | | **(3,927)** |
| | | | - | - |
| **2020/12/31 දිනට ශේෂය** | **(4,339)** | **425,113** | **-** | **437,690** |

ගිණුම් සඳහා සටහන්

ආයතනික තොරතුරු

**1.1** 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය "A" උප කාණ්ඩයේ නියාමන නියෝජිතායතනයන්හි "A" කාණ්ඩයේ ආයතනයක් වශයෙන් වර්ග කරන ලදී.

**1.2** **ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ වෙළඳාම විධිමත් කිරීමයි.

**1.3** 2020 වර්ෂය අවසානය වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 531 ක් විය.

**1.4** **සුවිශේෂී කොටස් හිමිකාරීත්වය / ස්කන්ධ**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලෙන් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදලින් ඇති කරන ලද අරමුදලේ ශුද්ධ ශේෂ මඟින් අරමුදලේ ස්කන්ධ නිරූපණය කෙරේ.

**1.5** **රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් පවතින විට එය රජයේ ප්‍රදානයක් වශයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතම හා සම්බන්ධයක් පවතියි නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමක් සඳහා වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකා ගණනය කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලබන විට එම ප්‍රදානයන් වත්කම්වල නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් සඳහන් කෙරේ.

**2.** **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳව කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් පිළියෙළ කර තිබේ.

**2.2** ඓතිහාසික පිරිවැය පදනම මත සහ සිදුවිය හැකි ගිණුම්කරණ වෙනස්වීම් පාදක කරගෙන මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

**2.3 දඩ මුදල් ආදායම**

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගන්නා බැවින් පෙර ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදි. එම නිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්‍රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

**2.3.2** අධිකාරිය විසින් දඩ මුදල් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටුයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංක අදාළ අධිකරණය විසින් මුදල් එවීමේදී ලබා දෙනු ලබන අංක හා අදාළ තොරතුරු එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදී ම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතියි. එම මුදල් සත්‍ය වශයෙන් ම අධිකාරිය සතුවිය යුතු මුදල් ද නැතහොත් අධිකරණය විසින් වැරදීමකින් එවන ලද මුදල් ද යන්න ප්‍රත්‍යක්ෂ කරන තෙක් සාමාන්‍යයෙන් අවිනිශ්චිත - දඩ මුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් නිශ්චිතව හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.3.3** පූර්ව අත්දැකීම් අනුව හඳුනා නොගත් දඩමුදල් ආදායමෙන් ඉතා ඉහළ ප්‍රමාණයක්, ලැබිය යුතු දඩ මුදල් වශයෙන් නිරූපණය විය.

**2.4 මුදල් වර්ෂය**

දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන ලිත් වර්ෂය අධිකාරියෙහි මුල්‍යවර්ෂය ලෙස සලකනු ලැබේ.

**3. වත්කම් පදනම් සහ ඒවායේ අගය තක්සේරුකිරීම්**

**3.1 දේපළ පිරියත සහ උපකරණ**

**3.1.1.** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ස්වකීය ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ගිණුම් ඇස්තමේන්තු සඳහා අපේක්ෂිත හඳුනාගැනීම් වශයෙන් පිරිවැය ආකෘතිය තෝරාගනු ලබයි. (SLPSAS 7)

**3.1.2** දේපළ පිරියත සහ උපකරණ ආදියෙහි අගය දැක්වීමේදී ඒවායේ ශුද්ධ / සමුච්චිත ක්ෂයවීමට දේපළ, පිරියත සහ උපකරණ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇති විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස් පිළිනොගෙන නව කොටස් ආශ්‍රිතව ජීව කාලය සහ ක්ෂයවීම හඳුනා ගනියි. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙහි සමුච්චිත හිමිකම් වශයෙන් දැක්වේ.

**3.1.3** වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදකිරීම් සඳහා වන පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

**3.1.4** කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැංවීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

### 3.1.5 ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්

කාර්යාලය බෙදා වෙන් කිරීම සඳහා පහත දැක්වෙන පරිදි වැය වූ මුදල මෙමඟින් නියෝජනය වේ.

| | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.) | 2020.12.31 දිනට සම්පූර්ණ කරන ලද / සහතික කරන ලද (රු.) | සිදුකරන ලද ගෙවීම (රු.) | ගෙවිය යුතු ශේෂය (රු.) |
|---|---|---|---|---|
| කාර්යාලය බෙදා වෙන් කිරීම - අනුරාධපුර | 1,376,300.00 | 730,500.00 | 730,500.00 | 0.00 |
| මුළු මුදල | **1,376,300.00** | **730,500.00** | **730,500.00** | **0.00** |

### 3.2 සියලුම වත්කම්

ලබා ගෙන ඇති සියලු වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ගණනය කරනු ලැබේ.

**3.2.1** දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ගැළපෙන පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

| | |
|---|---|
| කාර්යාලීය ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල කාමර බෙදා වෙන්කිරීම් (පාටිෂන්) | 20% |
| පාරිභෝගික නොවන භාණ්ඩ | 10% |

**3.2.2** ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සෘජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

**3.2.3** පුස්තකාල පොත් සඳහා .ක්ෂයකිරීම් සිදු කරනු නොලැබේ.

**3.2.4** වර්ෂයට අදාළ ක්ෂය විලම්භිත ගිණුමට බැර කරනු ලැබේ.

3.3 **ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගක දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01 ක මුදල ගෙවීම වසර 40 ක වඩා වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

### 3.4 ණය ගැතියන් සහ ලැබිය යුතු මුදල්

උපලබ්ධි වීමට ඇති ඇස්තමේන්තුගත වටිනාකම් මත ණය ගැතියෝ සහ ලැබිය යුතු මුදල් සඳහන් කර තිබේ.

**3.6** **මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

**3.6.1** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල් සහ බැංකු තැන්පතු අන්තර්ගත වේ.

**3.7** **ස්ථාවර තැන්පතු**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ස්ථිර තැන්පතු ආයෝජන යටතේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාළ කාලපරිච්ඡේදය තුළදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත ගණනය කරනු ලැබේ.

**4.** **වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1** **ගෙවිය යුතු මුදල්**

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

**4.2** **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ක්‍රම දෙකක් පවතින අතර එම ක්‍රම දෙක සඳහා ම දායකත්වය දැරිය යුතු ය.

**4.2.1** **නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මකින් ඔබ්බට ගිය පසු- රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. 2018 වර්ෂයේ සිට, LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' මගින් අවශ්‍ය වන පරිදි දැනට සිටින සියලුම සේවකයින් සඳහා සූත්‍ර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂිත ගණනය කරන ලදී. එනම් සේවක ප්‍රතිලාභ මත LKAS 19 ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවා ආරම්භයේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා තිබේ. නමුත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමූහයේ ආයතන සඳහා, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ සේවකයකු සම්බන්ධයෙන් වන වගකීම පැන නගින්නේ අඛණ්ඩ සේවා කාලය වසර 5ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නිරූපිත පොලී අනුපාත(භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය) භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලායාම වට්ටම් කිරීමෙන් වන අතර අදාළ වගකීම් වල නියමයන් වලට ආසන්නව කල්පිරීමට නියමයන් පවතියි. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන වටිනාකම රඳා පවතින්නේ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් සූත්‍ර පදනමක් මත තීරණය වන සාධක ගණනාවක් මත වේ.

2020 දෙසැම්බර් 31 වන දිනට සියලුම සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා ප්‍රතිපාදන **රුපියල් 84,141,474.24** විය. අර්ථ දක්වා ඇති විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නිර්ණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ. මෙම උපකල්පනවල ඕනෑම වෙනස්කමක් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ ධාරණ අගයට බලපානු ඇත.

| | 2020 |
|---|---|
| වට්ටම්ගත පොළී අනුපාතය | 6.32% |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | 5.00% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය | 2.00% |
| විශ්‍රාමගැනීමේ වයස | අවුරුදු 60 |

පාරිතෝෂික ප්‍රතිපාදන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අනුමැතිය ලබාගෙන තිබේ. වසර පහකට වැඩි සේවා කාලයක් ඇති සේවකයින් සඳහා පාරිතෝෂිත ආයෝජනය ගණනය කර තිබේ. පහත සඳහන් කර ඇත්තේ 2020/12/31 වන විට පාරිතෝෂිත ආයෝජනයේ සාරාංශය සහ ආයෝජනය කළ යුතු ශේෂයයි.

| | රු. |
|---|---|
| 2020.12.31 දිනට වසර 5 ට වඩා සේවා කාලයක් සහිත සේවකයන් සඳහා පාරිතෝෂික වෙන්කිරීම් | **70,092,828.00** |
| සමුච්චිත පොළිය සහිතව 2020.12.31 දිනට කරන ලද ආයෝජන | **72,461,719.00** |
| 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන | - |

**4.2.2 නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ආයතනය විසින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ.

සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% බැගින් වූ මුදල් අධිකාරිය විසින් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

**4.3 අවිනිශ්චිත වගකීම්**

**4.3.1** 2020.12.31 දිනට පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව නඩු 7 ක් ගොනු කර තිබූ අතර අදාළ අධිකරණය අනුව පහත ලෙස වර්ග කළ හැකි ය.

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 04 |
| අභියාචනාධිකරණය | 03 |
| මුළු සංඛ්‍යාව | 07 |

මෙම නඩු අතරින් විශාල ප්‍රමාණයක් ගොනුකර ඇත්තේ පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගිකයින් වෙත ලබා දෙන ලද තීරණ වලට එරෙහිවය ඇතැම් නඩු අධිකාරිය විසින් පළ කරන ලද ගැසට් පත්‍රවලවල වගන්ති වලට පටහැනිව වේ.කෙසේ නමුත් අගතියට පත් පාර්ශවයන් රැසක් අධිකාරියේ තීරණය අවලංගු කිරීම, සංශෝධනය කිරීම, හෝ පළ කරන ලද ගැසට් පත්‍ර අවලංගු කිරීම අපේක්ෂා කරන බැවින් අවිනිශ්චිතතා අගය ප්‍රමාණනය කර නොමැත.

**4.3.2.1** පාරිභෝගික ආරක්‍ෂාව සහතික කිරීම සඳහා තාක්‍ෂණය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිත සමාගම SICPA වන අතර එමඟින් යම් භාණ්ඩ ප්‍රමාණයක් විද්‍යුත් උපකරණයක් ආධාරයෙන් හඳුනා ගැනීම සිදු කෙරේ. නමුත් ගිවිසුම්ගත පරිදි පාරිභෝගික

කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එම ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැන නැඟුණු ආරවුල බේරුම් කිරීම සඳහා අයදුම්පතක් ගොනු කර තිබේ.

**4.3.2.2 ක්‍රියාත්මක නොකිරීම සඳහා හේතුව**

2014/02/24 දිනැතිව විධාන අංක 49 නිකුත් කිරීමෙන් අනතුරුව නිශ්චිත භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරිය දැනුවත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් ද පැවැත්විණි. එම විධානය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡා අසාර්ථක වූ බැවින්, ශ්‍රී ලංකා වතුර බෝතල් නිෂ්පාදකයන්ගේ සංගමය , බීම වර්ග නිෂ්පාදකයන්ගේ සංගමය සහ රූපලාවණ්‍ය නිෂ්පාදන නිෂ්පාදකයින් විසින් 2014/08/14 දින අභියාචනාධිකරණයේ (CAA/Writ/281/2014) ඉල්ලීමක් ගොනු කර ඇති අතර මෙම නඩුව මේ වන විටත් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතියි.

**4.3.2.3** SICPA විසින් රු. බිලියන 2.716 ක් හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් හෝ විකල්ප වශයෙන් රුපියල් බිලියන 3.887 ක් විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි මුදලක් සහ හිමිකම් කියන ලද හානි සඳහා පොලිය සහ බේරුම්කරණයේ සියලු පිරිවැය ඉල්ලා සිටින ලදී.

**4.3.3 බේරුම්රණ පිරිවැය**

I. බේරුම්කරණ පිරිවැය සඳහා තාවකාලික අත්තිකාරම් කොටසක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් 230,000.00 ක් වෙන ලෙස පාරිභෝගික කයුතු පිළිබඳ අධිකාරියට දන්වන ලදී. බේරුම්කරණ නඩුව 2020 වර්ෂයේ අගෝස්තු 20, 21, 22, 24, 25, 26, 27, 28, 29 , සැප්තැම්බර් 12 සහ ඔක්තෝබර් 21, 22, 23 දිනයන්හිදී කොළඹ බේරුම්කරණ මධ්‍යස්ථානයේදී විභාග කරන ලදී.

II. පාරිභෝගික කටටයුතු පිළිබඳ අධිකාරිය විසින් බේරුම්කරණ කටයුතු සඳහා රු. 22,162,690.00 ක මුදලක් 2020.12.31 දිනට වැය කර ඇති අතර ඒ පහත පරිදි වේ.

| බේරුම්කරණ වියදම් | Rs |
|---|---|
| විශේෂඥ උපදෙස් සඳහා ගාස්තු | 2,770,000.00 |
| බේරුම්කරණ මධ්‍යස්ථාන ගාස්තු/ විභාග කිරීම් සහ සංග්‍රහ වියදම් | 3,903,857.00 |
| විගණන ගාස්තු | 3,699,000.00 |
| එම අවස්ථාවිදී ම සිදුකරන පිටපත් කිරීමේ සේවා | 4,675,321.00 |
| උපදේශන ගාස්තු - නීතිපති දෙපාර්තමේන්තුව - | 6,948,500.00 |
| ලේඛන යැවීම සඳහා ගාස්තු සහ ලිපිද්‍රව්‍ය | 166,012.00 |
| | 22,162,690.00 |

**5.** ආදායම

**ආදායම හඳුනාගැනීම**

පාරිභෝගික අධිකාරිය වෙත ගලා ඒ යැයි අපේක්ෂිත ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇතිනම්, එම අදායම විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි ය.

**පොළී ආදායම**

නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කරනු ලැබේ. ස්ථාවර තැන්පතුවල සාමාන්‍ය පොළී අනුපාතය 9.83% වේ.

**රජයේ ප්‍රදාන**

ප්‍රදාන හිමිවේ යැයි සහතික කරගෙන සහ අදාළ සියලුම කොන්දේසි අනුකූල වේ යැයි සලකා රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ. ප්‍රධාන වියදම් අයිතමයකට සම්බන්ධ වන්නේ නම් (පුනරාවර්තන ප්‍රධාන) එය එම කාලය සඳහා ආදායමක් වශයෙන් සලකනු ලැබේ. ප්‍රදාන වත්කම් අයිතමයයක සම්බන්ධ වන්නේ නම් (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භිත ආදායමක් වශයෙන් සලකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා ආදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මූල්‍යමය නොවන ප්‍රදාන ලබාගන්නා විට වත්කම් සහ ප්‍රදාන දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි කාලය තුරා ආදායම් ප්‍රකාශයට ගණනය කරනු ලැබේ. (*/IAS 20)

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TCM/D/CAA/B/2020/8/7/7 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජූලි 20 දින

සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. / No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන සහතික කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වැරදි දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ එය දුස්සන්ධානයන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වැරදි දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇගයීම ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම

යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයීම ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනියාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | 2020 වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් අධිකාරිය කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය | අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 756(6) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදුකර අදාල සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අධිකාරිය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2020 සිට 2022 තුන් අවුරුදු කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 60 (6) වගන්තිය අනුව පෙර වැරදි කිහිපවරක් ඇතිවීමට වැරදිකරු කරනු ලබන ඇත්තන්ගේ නම් හා ලිපිනයන් අධිකාරිය සුදුසුයයි සලකන යම් ආකාරයකින් ප්‍රකාශයට පත් කර පාරිභෝගිකයා දැනුවත් කිරීමට කටයුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ආ) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 61(3) වගන්තිය අනුව 2020 වර්ෂයේ පරීක්ෂා කරන ලද සාම්පල් 299 ක් අතුරින් සාම්පල් 112 ක් නියමිත ප්‍රමිතියෙන් හා පිරිවිතරයන්ගෙන් තොර බව තහවුරු කර තිබියදීත් නියමිත ප්‍රමිතයෙන් හා පිරිවිතරයන්ගෙන් තොර භාණ්ඩ තහනම්ට ගෙන රඳවා තබා ගැනීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. වෙනත් කරුණු

---

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරී පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට වසර 16 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 667 ක් වන අතර තත්‍ය සේවක සංඛ්‍යාව 531 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 136 ක් පැවතුණි. 2020 වර්ෂයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වරින්වර පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා රු.831,222 ක් වැයකර තිබුණද විගණිත දිනය වන 2021 පෙබරවාරි 22 වන විට පුරප්පාඩු තනතුරු 3 ක් පමණක් පිරවීමට කටයුතු කර තිබුණි. එසේම විනය ක්‍රියාමාර්ග මත වැටුප් විලම්භනය කිරීම, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් නොවීම වැනි අඩුපාඩු පැවතියදීත් 2019 ඔක්තෝම්බර් 01 දින ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් 04 දෙනෙකු සඳහා

පත්වීම ලබා දී තිබුණු අතර අතිරේක/වෘත්තිය සුදුසුකම් සඳහා ලබාදුන් ලකුණු ප්‍රමාණයන් සම්බන්ධයෙන්ද නිර්ණායකයන් සකස් කර නොතිබුණි.

(ඇ) 2020 ජුලි 29 දිනැති අංක 2186/17 දරන ගැසට් පත්‍රය මඟින් රසායනාගාර පරීක්ෂණ සඳහා මිල පාලනය කර තිබුණ ද එම මිල පාලනය පාරිභෝගිකයා අතරට ගිය බවට සමීක්ෂණ කිරීමට කිසිදු වැටලීමක් පාරිභෝගික අධිකාරිය විසින් සිදුකර නොතිබුණි.

(ඈ) 2020 වර්ෂයේදී මහේස්ත්‍රාත් අධිකරණ මඟින් එවන ලද දඩ මුදල් වලින් රු.7,676,874 ක් වටිනා චෙක්පත් 154 ක් කල් ඉකුත් වී තිබීම හේතුවෙන් නැවත අධිකරණය වෙත යවා තිබුණි. එම චෙක්පත් මහේස්ත්‍රාත් අධිකරණ මඟින් නිකුත් කල දිනය හා එම චෙක්පත් නැවත අධිකරණ තවත යවන ලද දිනය අතර දින 45 ක පමණ කාලයක් පැවතීම යනු චෙක්පත් නිශ්කාෂණය කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් වුවද අධිකාරිය ඒ සඳහා ක්‍රියාකර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,556 කින් පැමිණිලි 678 කට 2020 දෙසැම්බර් 31 දින වන විට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 166 ක් ඉවත් කර තිබුණි. පැමිණිලි 256 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 456 ක් සඳහා කැදවීම් කිරීමට නියමිතව තිබුණි. මෙලෙස කැදවීම් කිරීමට නියමිත පැමිණිලි 456 න් පැමිණිලි 175 ක් 2018 වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමු කල පැමිණිලි විය. සමාලෝචිත වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමු කල පැමිණිලි 80 කින් පැමිණිලි 04 ක් පමණක් විසඳා තිබුණු අතර පැමිණිලි 74 ක් සඳහා කැදවීම් සිදුකර නොතිබුණි.

(ඊ) පාරිභෝගිකයින්ට ක්ෂණිකව වෙළඳපොලේ මිල ගණන් දැන ගැනීමට සහ ක්ෂණික පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 දුරකථන සේවාව 2013 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා රු.9,188,396 ක වියදමක් දරා තිබුණි. ක්ෂණික ඇමතුම් සහන සේවාවට 2020 වර්ෂයේ මාර්තු මස සිට දෙසැම්බර් මාසය දක්වා මහජන පැමිණිලි 5,104 ක් ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැමිණිලි 3790 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මාස 10 ක කාලයක් සඳහා ලද පැමිණිලි වලින් සියයට 74 ක් සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාස දෙකට අදාලව දත්ත ගබඩාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් වැටලීම් 15,923 ක් සිදු කර ඇති අතර, එය පෙර වර්ෂයේ සිදු කළ 24,061 ක් වූ වැටලීම් වලට සාපේක්ෂව සියයට 34 ක පහළ වැටීමක් වේ. තවද 2019 වර්ෂයේ දඩ ලෙස රු.39,094,340 ක ආදායමක් උපයා ඇති අතර සමාලෝචිත වර්ෂයේ එය රු.21,826,267 ක් දක්වා එනම් සියයට 44 ක පහත වැටීමකි.

(ඎ) නිවැරදි ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ පාරිභෝගිකයින්ට හඳුනා ගැනීමේ පහසුව සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් 2014 ජනවාරි 24 දින SICPA Security Solutions Switzerland ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර, අදාල ආයතනය සමඟ ගිවිසුම් පරිදි ක්‍රියාත්මක නොවීම මත 2018 වර්ෂයේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත සම්බන්ධයෙන් බේරුම්කරණයට ඉදිරිපත් වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම නඩු කටයුත්ත සම්බන්ධව අධිකාරියේ අරමුදලින් රු.මිලියන 55 ක් දක්වා වියදම් කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 49 (3) වගන්තියේ සඳහන් අරමුදලින් ගෙවිය හැකි වැය කිරීම් පිළිබඳ නියමයන් දක්වා තිබුණ ද එම නියමයන් ඉක්මවා යමින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 55 ක වියදම් ප්‍රතිපූරණය සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර එ අනුමැතිය මත ඉහත බේරුම්කරණය සම්බන්ධව රු.22,162,690 ක වියදමක් අරමුදල විසින් 2020 ජූලි සිට දෙසැම්බර් දක්වා දරා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතක විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව පිළිබඳව සභාපතිතුමාගේ අදහස් දැක්වීම**

1. මූල්‍ය ප්‍රකාශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති විසින් සකස්කොට ඇති තත්වාගණනය කළ මතය සම්බන්ධව අවධානය යොමු කල අතර, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම සහ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම සම්බන්ධයෙන් වූ කරුණු කෙරෙහිද මාගේ අවධානය යොමු කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන වල සටහන් වාර්තා කිරීමේ දෝෂය 2021 වර්ෂයේ නිවැරදි කර ඉදිරිපත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වූ විගනකගේ නිරික්ෂනයන්ද මා විසින් අධ්‍යයනය කරන ලදුව ඒ පිළිබඳව අකාර්යක්ෂමතාවයක් වෙතොත් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

**2.2.2** (අ), (ආ) සහ (ඇ)

මෙම වාර්තා පිටපත් 2020.05.11 දින විගණන කාර්යාලයට ඉදිරිපත් කර ඇත.

(ඇ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2020 සිට 2022 සඳහා තුන් අවුරුදු සැලැස්මක් සකසා තිබූ අතර පැවති වසංගත තත්වය හේතුවෙන් 2021 සඳහා සැලසුම්කර තිබූ ක්‍රියාකාරකම් අධ්‍යයනය කර 2021 වර්ෂයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව 2021 වර්ෂය සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාවට නංවන ලදී.

**2.2.3**

(අ) ඉදිරියේදී මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර වැරදි සිදු කල පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

(ආ) මෙහිදී 12 වන වගන්තිය මගින් ප්‍රමිතිය අනිවාර්ය කරමින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන භාණ්ඩ හැර අනෙකුත් භාණ්ඩ සඳහා කරනු ලබන නියැදි පරික්ෂාවගෙන් අහිතකර ප්‍රතිපල ලැබුනත් එවැනි භාණ්ඩ තොග රඳවා ගැනීමට හෝ තහනමට ගැනීම පනතින් ප්‍රතිපාදන ලැබී නොමැත. එවැනි අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි කටයුතු කරනු ලබයි.

3. **වෙනත් කරුණු**

(අ) නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත සංශෝධන පරික්ෂා කර නීතිපති වෙත යොමුකොට, ඉන් අනතුරුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට යොමු කොට තිබුණි. අනතුරුව අමතර සංශෝධන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතට ඇතුලත් විය යුතු බව තීරණය විය. ඒ අනුව එම සංශෝධන ද ඇතුලත්ව නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කොට ඇත.

(ආ) 2020 වර්ෂය අවසන් වන විට පැවති පුරප්පාඩු 136න් 82ක් විමර්ශන නිලධාරීන් සඳහා වේ. කෙසේ වෙතත් 2018 වර්ෂයේ මු.රේ.71 අනුව කාර්යය මණ්ඩල අවශ්‍යතාව සාධාරණීය නොකර විමර්ශන නිලධාරින් 207ක් බන්දවාහෙන ඇති අතර දිස්ත්‍රික් කාර්යාල වලට විමර්ශන නිලධාරින් ප්‍රමාණවත් බැවින් තවත් විමර්ශන නිලධාරින් බඳවා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත.
තවද, 2020 වසර ඇතුලත බඳවා ගැනීම් පුරප්පාඩු දැන්වීම් පළකර ඇත්තේ තනතුරු 10ක් සඳහා වන අතර ඉන් තනතුරු 06ක් සඳහා බන්දවාගෙන් ඇත. එහෙත් රට තුල පවතී සංචරණ සීමා සහ නිරෝධායන ඇදිරිනිතිය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම කල් දැමීමට සිදුවිය.
2019 ඔක්තෝබර් 01 දින ජ්‍යෝෂ්ඨ විමර්ශන නිලධාරින් 04 දෙනෙකු සඳහා පත්වීම් ලබා දීම පිළිබඳ මූලික විමර්ෂණයක් අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් අනුව පැවැත්වීමට කටයුතු කර ඇත.

(ඇ) විගණන කරන දිනය වනවිට ගැසට්පත්‍රයේ පළකර ඇති රසායනාගාර පරීක්ෂණ සඳහා අයකරන ගාස්තු සම්බන්ධව වැටලීම් කර නොතිබුණ ද අධිකාරිය මේ සම්බන්ධව අවධානය යොමුකර විමර්ශනයන් සිදුකරන අතර, බොහෝ රසායනාගාර පාලන මිලට එම පරීක්ෂණ සඳහා ගාස්තු අයකර ඇත. පාලන මිලට වැඩියෙන්

ගාස්තු අයකළ රසායනාගාරයක් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකර ඇති අතර, රට යථාතත්ත්වයට පත්වී අධිකරණ කටයුතු ආරම්භ වූ විට ඒ සඳහා නඩු පැවරීමට කටයුතු කිරීමට නියමිතයි. රසායනාගාර පරීක්ෂණ සඳහා අය කරන ගාස්තු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන ලෙස සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙම චෙක්පත් අධිකාරිය වෙත ලැබෙන විටත් චෙක්පත් වලංගු කාලය ඉක්මවා ගොස් තිබීම නිසා වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා අදාළ අධිකරණය වෙත නැවත යවා ඇති චෙක්පත් වේ. පසුගිය වර්ෂයේ (2020)රටේ පවතී කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් තැපැල් කාර්යාල වසා දැමීම හා එම ප්‍රදේශ හුදකලා කර තිබීම සහ කාර්යාල වෙත සේවකයින් ගෙන්වා ගැනීම සීමා කිරීම ආදී හේතුන් නිසා මෙවැනි ප්‍රමාණයක් චෙක්පත් කාලය ඉකුත්වී දින දීර්ඝ කර ගැනීම සඳහා නැවත අධිකරණය වෙත යැවීමට සිදුවිය.

(ඉ) 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1556කින් 524කත 2020.12.31 දින වන විට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 166ක් ඉවත්කර තිබුණි. පැමිණිලි 410ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුන අතර පැමිණිලි 456ක් සඳහා කැඳවීම් කිරීමට නියමිතව තිබුණි. මෙලෙස කැඳවීම් කිරීමට නියමිත පැමිණිලි 456න් පැමිණිලි 175ක් 2018 වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමු කල පැමිණිලි විය. සමාලෝචිත වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමුකළ පැමිණිලි 80කින් පැමිණිලි 04ක් පමණක් විසඳා තිබුණු අතර පැමිණිලි 74ක් සඳහා කැඳවීම් සිදුකර නොතිබුණි.

(ඊ) කෝවිඩ් 19 වසංගත තත්ත්වය මත නිලධාරීන් නිසි පරිදි සේවයට කැඳවීමට නොහැකි වීම නිසා 1977 කෙටි දුරකථන අංකය ඔස්සේ ලැබුණ පැමිණිලි සඳහා සාර්ථකව කටයුතු කිරීමට නොහැකි විය. 2020 මාර්තු මස සිට දත්ත පද්ධතියක් සකස් කර සියළුම දිස්ත්‍රික් කාර්යාල වෙත අදාළ පැමිණිලි යොමු කිරීමටත්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග එම දත්ත පද්ධතියටම අදාළ දිස්ත්‍රික් කාර්යාල මඟින් ඇතුළත් කිරීමටත් හැකිවන පරිදි දත්ත පද්ධතිය දියුණු කර ඇත. ඒ අනුව වර්තමානයේ 1977 කෙටි දුරකථන මාර්ගය ඔස්සේ ලැබෙන මහජන පැමිණිලි කඩිනමින් පරීක්ෂා කිරීම් සිදුවෙමින් පවතී.
විගණන දිනට 2020 ජනවාරි, පෙබරවාරි මාස දෙකෙහි දත්ත, දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. මේ වනවිට එය යාවත්කාලීන කර ඇත.

(උ) 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ වැටලීම් සංඛ්‍යාව පහළ අගයක් ගන්නා බව පිළිගනිමි. 2020 වර්ෂය සඳහා වැටලීම් 26,004 ක සංඛ්‍යාවක් වර්ෂය ආරම්භයේ සැළසුම් කරන ලද නමුත්, කොවිඩ් වසංගත තත්ත්වය 2020 වර්ෂයේ මාර්තු මස සිට ඉහල ගිය හෙයින්, ක්ෂේත්‍ර රාජකාරී කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විම නිසා අදාළ වර්ෂයේ සත්‍ය වැටලීම් සංඛ්‍යාව 15,923කට සීමා වී ඇත.
ඒ අනුව 2019 වර්ෂයේ දඩ මුදල් ආදායමට සාපේක්ෂව 2020 වර්ෂයේ දඩ මුදල් ආදායම පහත අගයක් පෙන්වනු ලබයි. කෙසේ වෙතත් සාමාන්‍යයෙන් වැටලීම් සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පැවරීමේ දී එම නඩු සඳහා දඩ මුදල් තීරණය කරනු ලබන්නේ අදාළ අධිකරණයේ මහේස්ත්‍රාත්තුමා විසිනි. එමනිසා වැටලීම් සඳහා දඩ මුදල් තීරණය කිරීම පාරිභෝගික අධිකාරියෙන් පරිබාහිරව සිදුවන කටයුත්තකි.

(ඌ) අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී තිබු නිර්දේශ සලකා ජාත්‍යන්තර බේරුම්කරණ නඩු කටයුත්ත සඳහා අවශ්‍ය වියදම් අධිකාරියේ අරමුදලින් දැරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර ඒ අනුව රු.22,162,690 දරන ලදී.

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික)
**සභාපති**